දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 61 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

භූගෝල විද්‍යාව II

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

1.

**(අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.**

(i) A - B රේඛාවෙන් දැක්වෙන්නේ කුමක් ද?
(නෙරුව / නිම්නය / මොහොර) (ලකුණු 01යි)

(ii) E - F රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(අඩි පාර / දියබෙත්ම / රූළි බිම) (ලකුණු 01යි)

(iii) G - H රේඛාවෙන් දැක්වෙන්නේ කුමක් ද?
(කොත් කන්ද / මද බෑවුම / කපොල්ල) (ලකුණු 01යි)

(iv) C - D රේඛාව ඔස්සේ ඇති,
a. භෞතික ලක්ෂණයක්
b. සංස්කෘතික ලක්ෂණයක් නම් කරන්න. (ලකුණු 02යි)

(v) ඇතුළු මායිම් තීරුවේ සඳහන් වී ඇති ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02යි)

(vi) X අක්ෂරයෙන් දක්වා ඇති මායිම කුමක් ද? (ලකුණු 01යි)

(vii) නිරිතදිග කෙළවරේ දී ඇති චතුරස්‍රය තුළ හඳුනාගත හැකි මානව කටයුතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

1. (අ)




SCALE 1 : 50,000

භූගෝල විද්‍යාව II

Geography II

1· (අ)

I. ------------------------------------------------------------------------------------------

II. ------------------------------------------------------------------------------------------

III. ------------------------------------------------------------------------------------------

IV. ------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

V. ------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

VI. ------------------------------------------------------------------------------------------

VII. ------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

10

**(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.**

- **අංක (i) සිට (v) දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතරින් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.**

(i) අර්ධ වශයෙන් ගොඩබිමින් වට වී ඇති **'කළු මුහුද'** (A) (B) (C)

(ii) කිරිපට්ටි පාලනයේ ප්‍රමුඛ රටක් වන **'නවසීලන්තය'** (D) (E) (F)

(iii) භූමියේ උසින් ම පිහිටි විල වන **'ටිටිකාකා'** (G) (H) (I)

(iv) හරිකේන් සුළං බලපැවැත්වෙන **'මෙක්සිකෝ බොක්ක'** (K) (L) (M)

(v) හෙක්ලා ගිනිකන්ද පිහිටි **'අයිස්ලන්තය'** (P) (Q) (R)

**(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.**

- **අංක (i) සිට (v) දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.**

(i) කෘෂි තාක්ෂණික උයනක් පිහිටි **'ගන්නෝරුව'** (A) (B) (C)


(ii) සුළු අපනයන භෝග මධ්‍යස්ථානය පිහිටි **'මාතලේ'** දිස්ත්‍රික්කය (D) (E) (F)

(iii) ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය පිහිටි **'සපුගස්කන්ද'** (G) (H) (I)

(iv) දැඩි ස්වාභාවික රක්ෂිතයක් වන **'රිටිගල'** (K) (L) (M)

(v) නිතර ගංවතුර උවදුර සිදු වන **'කළු ගඟ'** (P) (Q) (R)

**(ආ)**




(i)


(ii)

(iii)

(iv)

(v)

**(ඉ)**




(i)

(ii)

(iii)

(iv)

(v)

## II කොටස

2.

(i) ලෝකයේ විශාලතම මහාද්වීපය සහ කුඩා ම මහාද්වීපය පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) පහත සඳහන් මහාද්වීපික තටක තුළ පිහිටි රටවල් එක බැගින් නම් කරන්න.


i. ආසියා මහාද්වීපික තටකය තුළ -

ii. ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය තුළ -

iii. අප්‍රිකා මහාද්වීපික තටකය තුළ - (ලකුණු 3 යි)

(iii)

a. සාගර පතුල දැක්වෙන පහත රූප සටහනේ A, B, C ලෙස දක්වා ඇති ලක්ෂණ නම් කරන්න.




b. සාගර හා මුහුදු, මිනිසා විසින් සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගන්න අවස්ථා දෙකක් පැහැදිලි කරන්න.


(ලකුණු 5 යි)

3. (i) a). ආසියාවේ වී වගා කරන රටක්

b). ආසියාවෙන් බැහැර වී වගා කරන රටක් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) වී වගාව ආශ්‍රිත ව දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 3 යි)

(iv)a). පහත සිතියමේ A, B ලෙස නම් කර ඇති තිරිඟු වගා කරන රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න.




b). ලෝක කෘෂිකර්මාන්තයෙහි තිරිඟු ප්‍රධාන භෝගයක් ලෙස වැදගත් වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

4. (i) ලෝකයේ ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) වර්තමානය වන විට දියුණු තාක්ෂණය පදනම් කර ගෙන විවිධ අවශ්‍යතා අනුව නිෂ්පාදනය කර ඇති නැව් වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 3 යි)

(iii) ලෝක නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ බලශක්තිය ආශ්‍රිත ගැටලු දෙකක් නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

5. (i) ශ්‍රී ලංකාවෙන් ලබා ගන්නා මිනිරන් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) සංචාරක ව්‍යාපාරයෙන් රටකට ලබා ගත හැකි ආර්ථික ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න.


(ලකුණු 3 යි)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ගෘහ කර්මාන්තය නඟා සිටුවීමට රජය මගින් ක්‍රියාත්මක කරන කාර්යයන් තුනක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

6. (i). පරිසරයේ ඇති සම්පත්, ලබා ගන්නා ආකාරය අනුව වර්ගීකරණය කර දක්වන්න. (ලකුණු 2 යි)

(ii). පෘථිවියෙහි ජලය ගබඩා වී ඇති ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 3 යි)

(iii). a) පහත සිතියමේ A, B ලෙස දක්වා ඇති වනාන්තර වර්ග දෙක පිළිවෙළින් නම් කරන්න.




b) වර්තමානයේ වනාන්තර හා වන ජීවීන් මුහුණපාන ගැටලු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 5 යි)

7. (i) සංවර්ධනය මැනීමේ දී යොදා ගන්නා මිනුම් වර්ග දෙක කුමක් ද ? (ලකුණු 2 යි)

(ii) දැනුම පදනම් කරගත් සංවර්ධනය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය මගින් මානව සමාජයට සැලසී ඇති පහසුකම් තුනක් දක්වන්න. (ලකුණු 3 යි)

(iii) ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා ඇති මූලාශ්‍ර තුනක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

8. (i). මානුෂ ක්‍රියාකාරකම් අතරින් පරිසරයට අහිතකර බලපෑම් ඇති කරන හෝ පරිසර හිතකාමී නොවන ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 යි)

(ii). ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇති විය හැකි බලපෑම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 3 යි)

(iii). දේශගුණික වෙනස් වීම් අවම කර ගැනීමට ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

*****